## සමාජ සේවා දෙපාර්තමේන්තුව

### ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

### වෘත්තීය උපදේශක (III ශ්‍රේණිය)

සමාජ සේවා දෙපාර්තමේන්තුවේ මඩකලපුව දිස්ත්‍රික්කයේ ආරම්භ කිරීමට නියමිත ආබාධිත පුද්ගලයින් සඳහා වන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන සඳහා වෘත්තීය උපදේශක තනතුරු 02ක් බඳවා ගැනීමට ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. පහත දැක්වෙන අයදුම් පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, සමාජ සේවා දෙපාර්තමේන්තුව, 02 වන මහල, II අදියර, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට **2021.03.05** දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙලවරේ "වෘත්තීය උපදේශක (III ශ්‍රේණිය) සඳහා බඳවා ගැනීම" යනුවෙන් සඳහන් කර තිබිය යුතුය. www.socialservices.gov.lk වෙබ් අඩවිය හරහා ද ආදර්ශ අයදුම්පත හා විස්තර ලබා ගත හැක.

*මෙම තනතුරට බඳවා ගැනීම සඳහා වන සුදුසුකම් :*

1. වෘත්තීය උපදේශක ( ඉලෙක්ට්‍රොනික්,මැහුම්,)

1.1 වයස් සීමාව :

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු : 18 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුයි.

1.2 අධ්‍යාපන සුදුසුකම් :

(අ) වෘත්තීය උපදේශක (ඉලෙක්ට්‍රොනික්,මැහුම්) තනතුරු සඳහා අධ්‍යාපන සුදුසුකම්

(i) සිංහල/දෙමළ/භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයක් සහිතව එක් වරකදී විෂයයන් හයකින්(06) අ.පො.ස.(සා.පෙළ) විභාගය සමත්ව තිබීම; සහ

(ii) අධ්‍යන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ඕනෑම විෂය ධාරාවකින් සියලුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව, තෘතියික අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම.

1.3. *වෘත්තීය සුදුසුකම් :*

අදාළ වෘත්තීය පිළිබඳ ලංකා කාර්මික විද්‍යාලයෙන් හෝ ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ දෑ අවුරුදු හෝ ඊට වැඩි සහතික පත්‍රය;

හෝ

කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ හෝ පේෂකර්ම දෙපාර්තමේන්තුවේ දෑ අවුරුදු හෝ ඊට වැඩි සහතික පත්‍රය;

හෝ

සමාජ සේවා දෙපාර්තමේන්තුව හෝ ජාතික තරුණ සේවා සභාව හෝ ඊට අනුබද්ධ ආයතන මගින් පවත්වනු ලබන දෑ අවුරුදු හෝ ඊට වැඩි පාඨමාලා සහතික පත්‍රය;

හෝ

වෘත්තීය පුහුණු අධිකාරිය හෝ ඊට අනුබද්ධ ආයතනයකින් ලබා ගත් අදාළ වෘත්තීය පිළිබඳ දෑ අවුරුදු හෝ ඊට වැඩි සහතික පත්‍රය ලබා ගැනීම;

හෝ

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ජාතික වෘත්තීය කුසලතා ( NVQ ) පහ (05) මට්ටමට ඇතුළත් වන්නා වූ අදාළ තාක්ෂණික පාඨමාලාවක් හෝ ඒ හා සමාන යැයි තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන පාඨමාලාවක් සාර්ථකව හදාරා සහතික ලබා තිබීම.

1.4. *පළපුරුද්ද :*

අදාළ නොවේ.

1.5. *කායික සුදුසුකම් :*
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

1.6. *වෙනත් :*

i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වීම
ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්තවීම
iii. තනතුරට බඳවාගැනීම සඳහා වන 1.1 සිට 1.6 දක්වා වන සියලුම සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට්* පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

1.7. *බඳවා ගැනීමේ ක්‍රමය :*

ලිඛිත හා වෘත්තීය පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. පළමුව ලිඛිත පරීක්ෂණය පැවැත්වේ. ලිඛිත පරීක්ෂණයෙන් සමත් වූවන් අතුරින් ඉහලම ලකුණු ලැබූ කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලැබූවන් පමණක්



වෘත්තීය පරීක්ෂණයට යොමු කරනු ලැබේ. වෘත්තීය පරීක්ෂණයෙන් ද සමත් වූවන් ඔවුන් ලිඛිත පරීක්ෂණයේදී ලබාගත් ලකුණුවලත් වෘත්තීය පරීක්ෂණයේදී ලබාගත් ලකුණුවලත් මුළු එකතුව අනුව කුසලතා අනුපිළිවෙලින් පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් පුහුණු පාඨමාලාව සඳහා තෝරා ගනු ලැබේ. එම පිරිස මාස 03ක් ඉගැන්වීමේ ක්‍රම පිළිබඳ පුහුණු පාඨමාලාවක් හදාරා සාර්ථකව නිම කර සහතිකයක් ලබා ගත යුතුය. එසේ සහතික ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් තනතුරට බඳවා ගනු ලැබේ.

1.7.1. ලිඛිත පරීක්ෂණය :

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | කාලය පැය 01 | 100 | 40 |
| අවබෝධය | කාලය පැය 01 | 100 | 40 |

1.8. වැටුප් පරිමාණය :
රා.ප.ච. 03/2016 අනුව MT- 01 -2016
වැටුප් පරිමාණය රු. 29,840-10x300-11x350-10x560-10x660-රු. 48,890/= වේ.

1.9. *සේවා කොන්දේසි :*
මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය, විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතු අතර වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් දායක මුදල් ගෙවිය යුතුය. රා.ප.ච. 01/2014 හා ඊට අනුශංගික චක්‍රලේඛ අනුව වසර පහක් තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය.

*සටහන*

- සමාජ සේවා අධ්‍යක්ෂක විසින් තීරණය කරනු ලබන ආයතනයක් මඟින් ලිඛිත පරීක්ෂණය කොළඹ දී පැවැත්වේ.
- ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් ඉල්ලුම් කළ යුතු අතර, තෝරා ගත් අයදුම්කරුවන් අදාළ පුරප්පාඩු සහිත ආයතනයේ වසර පහක අනිවාර්ය සේවයෙන් පසුව පමණක් වාර්ෂික ස්ථාන මාරු අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලබයි.

චන්දන රණවීර ආරච්චි,
සමාජ සේවා අධ්‍යක්ෂ.

2021 පෙබරවාරි මස 12 වැනි දින,
සමාජ සේවා දෙපාර්තමේන්තුව,
2 වන මහළ,
II වන අදියර,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

.......................................... තනතුර සඳහා බඳවාගැනීමේ අයදුම් පත්‍රය

භාෂා මාධ්‍ය :

01. මුලකුරු සමග නම :————.
02. මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
————.
03. ලිපිනය :————.
04. දුරකථන අංකය :————.
05. ජාතික හැඳුනුම්පත් අංකය :————.
06. උපන් දිනය :————.
07. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :- අවුරුදු :————. මාස :————. දින :————.
08. විවාහක/ අවිවාහක බව :————.
09. ස්ත්‍රී / පුරුෂ භාවය :————.



10. අධ්‍යාපන සුදුසුකම් :-

I. *අ.පො.ස. (සාමාන්‍ය පෙළ)*

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයයන් | ශ්‍රේණිය | විෂයයන් | ශ්‍රේණිය |
|---|---|---|---|
| ගණිතය | | | |
| සිංහල/දෙමළ/ඉංග්‍රීසි | | | |
| | | | |
| | | | |
| | | | |

II. *අ.පො.ස (උසස් පෙළ) :*

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයයන් | ශ්‍රේණිය | විෂයයන් | ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

11. වෘත්තීය හා වෙනත් සුදුසුකම් :

| පාඨමාලාවේ නම | ආයතනය | පාඨමාලා කාලය |
|---|---|---|
| | | |
| | | |

12. පළපුරුද්ද :

...........................................................................................................................
...........................................................................................................................
...........................................................................................

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය අනුව සත්‍ය හා නිවැරදි බව සහතික කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

02-667